# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2043/13 - 2017 ඔක්තෝබර් මස 30 වැනි සඳුදා - 2017.10.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2014/3 හා 2017.04.11 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* පළ කරනු ලැබ ඇති ''අ'' උපලේඛනයෙහි අංක 07 යටතේ සඳහන් බලතල පැවරීම පහත පරිදි 2017.10.30 දින සිට බලපවත්වන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**''අ'' උපලේඛනය**

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 7. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම<br>II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 3/2016 ප්‍රකාරව කර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන සැලසීම. |
| | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"අ" උපලේඛනය (සම්බන්ධිතයි)

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් /රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/බඳවා ගැනීමේ පරිපාටිය අනුව උසස් වීම ලබා දීම. |

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2014/3 හා 2017.04.11 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයේ* අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ඒ. කුලතුංග,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 ඔක්තෝබර් මස 25 වැනි දින,
177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

11 - 721

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.